00147

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ
ඩිප්ලෝමා වැඩ සටහන - 4 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2013

ESD 2230 – ළමා සංවර්ධනය II

කාලය - පැය 03 යි.

---

දිනය - 2013.12.28 වේලාව - ප.ව. 01.30 - ප.ව.04.30

---

පළමු කොටසේ <u>සියළුම</u> ප්‍රශ්නවලටද, දෙවන කොටසේ ප්‍රශ්න <u>තුනකට පමණක්</u> ද පිළිතුරු සපයන්න.

<u>පළමුවන කොටස</u>

01. ප්‍රජානනය යනු කුමක්දැයි නිර්වචනයක් ඇසුරින් දක්වන්න.

02. වේදනාව සැහැල්ලු කිරීම සඳහා ස්නායු සම්ප්‍රේෂක ද්‍රව්‍යවල කාර්යභාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

03. පුද්ගලයන්ගේ ප්‍රධාන සංජානන ශෛලීන් දෙකක (02) ලක්ෂණ වෙන්කර දක්වන්න.

04. හෝමෝන වර්ග තුනක් (03) දක්වා ඒවායේ එකිනෙකෙහි කාර්ය භාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

05. ගුරුවරයකු වශයෙන් පෞරුෂය වර්ග සහ පෞරුෂය ගති ලක්ෂණ පිළිබඳ ඔබතුල ඇති අවබෝධය සිසුන්ගේ ඉගෙනුම සුසාධ්‍ය කිරීමට යොදා ගන්නා ආකාරය කෙටියෙන් පහදන්න.

06. දරුවන් තුල දක්නට ලැබෙන මනෝවිද්‍යාත්මක අක්‍රමතා පහක් (05) නම් කර ඒවායින් එකක් පැහැදිලි කරන්න.

07. පෞරුෂය පරීක්ෂණ ළමුන් සමඟ භාවිතා කිරීමේ ප්‍රබලතා දෙකක් (02) සහ දුබලතා දෙකක් (02) කෙටියෙන් පැහැදිලි කරන්න.

08. උදාහරණ දෙමින් සමරූපතාවය සහ සංවෘතිය යන මූලධර්ම කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 5 x 8 = 40)

## දෙවන කොටස

09. (i) සියළුම ප්‍රජානන ක්‍රියාවලින් තුළදී අවධානයෙහි ඇති වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ii) ළමුන්ගේ අවධානයට බලපෑම් කරන බාහිර සාධක පහක් (05) කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 07)

(iii) ළමුන්ගේ අවධානය කෙරෙහි බලපාන ඉහත සඳහන් කළ බාහිර සාධකවල බලපෑම අවම කිරීම සඳහා සුදුසු උපායමාර්ග පහක් (5) දක්වන්න. (ලකුණු 07)

10. ඌන අවධානය සහිත අධික්‍රියාකාරී අක්‍රමතාව සාමාන්‍ය වශයෙන් ළමයින්ට බලපාන අක්‍රමතාවයකි.

(i) මෙම අක්‍රමතාවයේ රෝග ලක්ෂණ දක්වන්න. (ලකුණු 04)

(ii) ඌන අවධානය සහිත අධික්‍රියාකාරී අක්‍රමතාව පෙර පාසල් හෝ ප්‍රාථමික පාසල් ළමුන්ගේ ඉගෙනුමට බලපෑ හැකි ආකාරය සාකච්ඡා කරන්න. (ලකුණු 08)

(iii) ඌන අවධානය සහිත අධික්‍රියාකාරී අක්‍රමතාවය සහිත ළමුන්ගේ ඉගෙනීමට සහයවීම සඳහා ඉගැන්වීම ක්‍රියාවලිය තුල ගුරුවරයකු වශයෙන් ඔබ ගන්නා පියවර හෝ උපාය මාර්ග තුනක් (3) විස්තර කරන්න. (ලකුණු 08)

11. රොජර්ට අනුව ළමුන් නිරතුරුවම තමා අවට සිටින වැඩිහිටියන්ගේ අගයයන් හා අදහස්වල බලපෑමට හසුවෙයි.

(i) රොජර්ගේ න්‍යායට අනුව වැඩිහිටියන්ගේ අගයයන් සහ අදහස් ළමුන්ගේ පෞරුෂයට බලපාන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) රොජර්ගේ න්‍යායට අදාලව ළමුන්ගේ පෞරුෂ සංවර්ධනයට ඔබ සහය දෙන ආකාරය සාකච්ඡා කරන්න. (ලකුණු 10)

12. “ද්‍රව්‍යයන් සංජානනය කිරීම සඳහා, සංවේදී ප්‍රතිචාර ග්‍රහණය කරගන්නා අවස්ථාවේ සංදර්භය මෙන්ම අපගේ අතීත අත්දැකීම් ද එක හා සමානව වැදගත් වේ.”

(i) ඉහත කියමන සුදුසු උදාහරණ දෙමින් සනාථ කරන්න. (ලකුණු 10)

(ii) පෙර පාසල් හෝ ප්‍රාථමික පාසල් ගුරුවරයකු ලෙස ඔබ විසින් උගන්වනු ලබන සංකල්පවල අර්ථය නිවැරදිව අවබෝධ කරවීම වැඩිදියුණු කිරීම සඳහා ඔබ විසින් සැලකිල්ලට ගන්නා සාධක මොනවාදැයි සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

13. පහත සඳහන් දෙකක් (02) පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) සමාජ ඉගෙනුම් න්‍යායට අනුව පෞරුෂය

(ii) දරුවන්ගේ චර්යා හැඩගැස්වීම සඳහා ධනාත්මක හා ඍණාත්මක උපස්ථම්භන වල දායකත්වය

(iii) ගුරුවරයකුට දරුවන්ගේ චර්යාවන්හි ජීව විද්‍යාත්මක පදනම පිළිබඳ අවබෝධ ලබා ගැනීමේ ඇති වැදගත්කම

(ලකුණු 10 x 2 = 20)

හිමිකම් ඇවිරිණි.

THE OPEN UNIVERSITY OF SRI LANKA
FACULTY OF EDUCATION
FINAL EXAMINATION – 2013
DIPLOMA IN EARLY CHILDHOOD & PRIMARY EDUCATION PROGRAMME
– LEVEL 4
ESD2230 – CHILD DEVELOPMENT II
DURATION – THREE (03) HOURS.

---

Date: 28th December 2013 Time: 1.30 p.m.- 4.30 p.m.

---

Answer all questions in Part I and any three from Part II.

## PART I

01. Define cognition using a suitable definition.

02. Explain in brief the functions of neurotransmitters for releasing pain.

03. Differentiate the characteristics of **two (02)** perceptual styles of individuals.

04. State **three (03)** hormones and explain briefly the functions of each hormone.

05. As a teacher how you would use your understanding on personality traits and personality types to facilitate student learning.

06. State **five (05)** psychological disorders in children and explain one of them.

07. Explain in brief **two (02)** strengths and **two (02)** weaknesses in using personality tests with children.

08. Citing examples, explain in brief the principles of similarity and closure.

(5 x 8 = 40 marks)

00147

## PART II

09. i. Explain in brief the importance of attention in all cognitive processes.

(06 marks)

ii. Discuss in brief **five (05)** external factors that would influence children's' attention.

(07 marks)

iii. State **five(05)** strategies that are useful in minimizing the influence of the above mentioned external factors on children's attention.

(07 marks)

10. Attention Deficit Hyperactive Disorder (ADHD) is a common disorder that affects children's learning.

i. Highlight the symptoms of this disorder.

(04 marks)

ii. Discuss how would ADHD affect on learning of preschool or primary school children.

(08 marks)

iii. Describe three actions/strategies you would take as a teacher to facilitate learning of children with ADHD.

(08 marks)

11. "According to Rogers, children are constantly influenced by the values and opinions of the adults around them".

i. Explain in brief how would values and opinions of adults influence children's' personality in line with Roger's theory.

(10 marks)

ii. Discuss in line with Rogers' theory, how you would support children's' personality development.

(10 marks)

12. "The context in which sensory inputs are presented and our previous experiences are equally important for perceiving things"

    i. Justify the above statement, citing suitable examples.

    (10 marks)

    ii. As a preschool or primary school teacher discuss the factors you would take into account when promoting an accurate understanding about the meanings of the concepts you are teaching.

    (10 marks)

13. Write short notes on **two (02)** of the followings.

    i. Personality in line with social learning theory.

    ii. Contribution of positive and negative reinforcements in shaping behaviour of children.

    iii. Importance of gaining knowledge on the biological base of children's' behaviours for a teacher.

    (10 x 2 = 20 marks)

- *Copyrights reserved* -